# කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2018

**11 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය** - II කාලය පැය 02 යි

නම: ........................................................................ . විභාග අංකය: ................

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතරු සපයන්න.**

1) i. දේශපාලන පක්ෂ ක්‍රමයේ ස්වරූප දෙක්ක නම්කරන්න.
ii. පාලන ක්‍රමයක් ලෙස සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්ථමානයේ ක්‍රියාත්මක කිරිමේදී මතුවන ගැටලු දෙකක් සඳහන් කරන්න.
iii. යුරෝපයේ බිහිවූ ප්‍රථම ජාතික රාජ්‍යයන් දෙක නම් කරන්න.
iv. ඒකීය ආණ්ඩුක්‍රම පවතින රාජ්‍යයන්ට නිදසුන් දෙකක් සපයන්න.
v. බ්‍රිතාන්‍ය පාලන යුගය තුළ බලය විමධ්‍යගත කිරීම සඳහා ගෙන තිබූ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.
vi. සමාජ සාධාරණත්වය ගොඩ නැගීම බිඳ වැටීම කෙරෙහි බලපා ඇති හේතු දෙකක් සඳහන් කරන්න.
vii. පරිවර්තන ආර්ථිකයන්හි දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
viii. සංවර්ධනයේදි සලකා බැලිය යුතු අංශ දෙකක් නම් කරන්න.
ix. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ මූලධර්ම දෙකක් සඳහන් කරන්න.
x. නීතියේ මූලාශ්‍ර දෙකක් ලියන්න. (ලකුණු 2 x 10)

2) i. ඡන්ද කොට්ඨාස අනුව නියෝජිතයන් තෝරා ගැනීමේදි අත්වන වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
ii. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 3)
iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට දේශපාලන අවබෝධයක් ජනතාව සතුව තිබීම වැදගත්වේ. කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

3) i. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායක මණ්ඩලය සතු කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
ii. ජනාධිපති ආණ්ඩුක්‍රමයක විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 3)
iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන කටයුතු පවත්වාගෙන යාමේදී ජන සමාජයට ආණ්ඩුවෙන් ඉටුවිය යුතු වගකීම් තුනක් විස්තර කරන්න. (ලකුණු 5)

4) i. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ජනසමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 2)
ii. බහු සංස්කෘතික ජනසමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 3)
iii. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමේ වැදගත්කම කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

5) i. 1977 පසු විවෘත ආර්ථික ප්‍රතිපත්ති යටතේ පෞද්ගලික ව්‍යවසායකයන් දිරි ගැන්වීම සඳහා හඳුන්වා දෙනු ලැබූ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
ii. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන වෙළඳපොළ ආර්ථික ක්‍රමයක ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 3)
iii. තිරසාර සංවර්ධනයේදි සැලකිය යුතු කරුණු තුනක් විස්තර කරන්න. (ලකුණු 5)

6) i. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන විශේෂ නීති වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 2)

ii. නීතියේ ආධිපත්‍ය තහවුරු වී ඇති සමාජයක දැකිය හැකි ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

iii. අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසඳලීම සිදු නොවීම නිසා ඇතිවිය හැකි අවාසිදායක තත්ත්වයන් තුනක් විස්තර කරන්න. (ලකුණු 5)

7) i. මානව හිමිකම් දිනාගැනීම සම්බන්ධයෙන් වැදගත්වන ඓතිහාසික අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 2)

ii. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

iii. මානව අයිතිවාසිකම් හා බැඳුණු යහපත් පුරවැසියකු වශයෙන් ඉටුකළ යුතු සාදාචාරාත්මක යුතුකම් ද වේ. එවැනි යුතුකම් තුනක් විස්තර කරන්න. (ලකුණු 5)